ප්‍රගතිශීලී ස්ත්‍රී එකමුතුව
ජාතික ජන බලවේගය

# ස්ත්‍රී ප්‍රඥප්තිය

## Manifesto

Progressive Women's Collective | National People's Power

ගොඩනැගෙන ඇගේ බලය
අපේක්ෂාව කරා

அவளின் நம்பிக்கை தரும்
எதிர்பார்ப்புக்களை கட்டியெழுப்புவோம்

**BUILDING WOMEN'S POWER
TOWARDS HOPE**

ප්‍රගතිශීලී ස්ත්‍රී එකමුතුව
ජාතික ජන බලවේගය

# ස්ත්‍රී ප්‍රඥප්තිය

## Manifesto

Progressive Women’s Collective | National People’s Power



ගොඩනැගෙන ඇගේ බලය
අපේක්ෂාව කරා

அவளின் நம்பிக்கை தரும்
எதிர்பார்ப்புக்களை கட்டியெழுப்புவோம்

**BUILDING WOMEN’S POWER TOWARDS HOPE**

# ස්ත්‍රී ප්‍රඥප්තිය

ප්‍රගතිශීලී ස්ත්‍රී එකමුතුව
ජාතික ජන බලවේගය

වර්තමාන ශ්‍රී ලාංකීය දේශපාලන සන්දර්භය තුළ මතු වී ඇති අර්බුදකාරී තත්ත්වය හමුවේ ස්ත්‍රීන්ට බලපාන සමාජ-ආර්ථික, සංස්කෘතික, සහ දේශපාලනික ගැටළු ශ්‍රී ලාංකීය දේශපාලන සංවාදයේ කේන්ද්‍රීය අවධානයට යොමු කිරීම අපගේ මූලික අභිප්‍රායයි. ඒ සඳහා විවිධ ස්ත්‍රීවාදී, විමුක්තිවාදී, වාමවාදී අදහස් දරන කණ්ඩායම් සහ පුද්ගලයන්ගේ විකල්ප දේශපාලනික අවකාශයේ බලපෑම් කණ්ඩායමක් වශයෙන් අපි සංවිධානය වී සිටිමු.

**අප සංවිධානයෙහි මූලික දේශපාලනික ස්ථාවර පැහැදිළි කිරීම මෙම ප්‍රතිපත්ති ප්‍රකාශයේ අරමුණයි.**

ස්ත්‍රීන් යනු සමස්ත සමාජ දේහය පුරාම විහිදී පැතිරී පවතින ප්‍රධාන බලවේගයක් ලෙස අපිසළකමු. මේ මොහොතේ සමාජය තුළක්‍රියාත්මකවන අර්බුදය තේරුම් ගැනීමේදී සමාජමය, ආර්ථික-දේශපාලනික, හා සංස්කෘතිකමය වශයෙන් විහිදී පවතින විවිධ ගැටළු ගණනාවක් අපි හඳුනා ගනිමු. ඒවා විනිවිදයන අයුරින් අන්තර් සබඳතාවයන්ගෙන් මෙන්ම වෙනස්වීම්වලින් යුක්තව  ද එනම් ස්වාධීනව මෙන්ම ස්වායක්තවද පවතියි. අප මේ දෙස ස්ත්‍රීවාදී දෘශ්ඨිකෝණයකින් බැලීමේදී පෙනී යන්නේ සමාජය තුළ ස්ත්‍රියවීම ප්‍රධාන සමාජ-ආර්ථික, සංස්කෘතික, සහ දේශපාලනික ක්‍රියාවලියෙන් ආන්තිකකරණය වී පැවතීම හේතු කොට ගෙන ඇය නිරතුරුවම අසාධාරණයට, අයුක්ති සහගතභාවයට සහ අසමාන තත්වයකට ඇද දමා නොසලකාහැර තිබෙන බවයි. මෙම තත්වය නිවසෙහි, සමාජය හා ප්‍රජාව අතර, වැඩබිමේදී, දේශපාලන තලයේ දී යනාදී සෑම ක්ෂේත්‍රයක් තුළම පැතිර පවතී. ධනවාදී ක්‍රමවේදය සහ පසුගිය දශක කිහිපය තුළ ඉස්මතු වූ නවලිබරල් ආර්ථික කතිකාව තුළ මේ තත්ත්වය වඩාත් උග්‍ර වී තිබේ. ස්ත්‍රීන්ගේ භූමිකා පුළුල් වී ඇති බවක් මතුපිටින් පෙනී ගියද,එයින්  ස්ත්‍රීන් මත දැරිය නොහැකි පීඩනයන් පටවා තිබේ. ස්ත්‍රීවාදීන් ලෙස අප බලාපොරොත්තු වන ව්‍යුහාත්මක සහ දෘෂ්ඨිවාදීමය වෙනසක් ඒ මගින් සිදු වී ඇති සෙයක් නොපෙනේ. ඒ වෙනුවට සූරාකෑම සහ දෘෂ්ඨිවාදාත්මක ලෙස ස්ත්‍රී අනන්‍යතාවය වෙළඳපොළකරණය කිරීම ඉහළ ගොස් තිබීම හා ඒ මගින් ඇය ලාභ උපයන භාණ්ඩයක් බවට පත්කිරීම තවත් තීව්‍රකර තිබේ. පශ්චාත් යුධ වාතාවරණයන් තුළ සත්‍යය සහ යුක්තිය සොයා යන වැන්දඹු, අවිවාහක, ස්වාමි පුරුෂයා විසින් අත්හරින ලද හෝ වෙනස් හැකියාවන් සහිත ස්ත්‍රීහු මෙහි දී වැඩි අසාධාරණයන්ට ලක් වෙති.

ශ්‍රමය ස්ත්‍රීකරණය වීම තුලින් සමස්ත ජාතික ආර්ථිකයෙහි ප්‍රමුඛ ආදායම් උපයන්නන් බවට ස්ත්‍රීන් පත් වීමත්සමග ම ස්ත්‍රීන් හා පුරුෂයින් යන දෙකොට්ඨාශයම  අවදානමට ලක් වූ ශ්‍රමිකයන් බවට පත් වී තිබේ. තවද අධ්‍යාපනය, සෞඛ්‍යය ආදී අත්‍යාවශ්‍ය සේවාවන් හා සමාජ ආරක්ෂණ සේවා දුර්වල වීමෙන් ඒවායෙහි බලපෑමට ස්ත්‍රීන් සෘජුව ලක් වී තිබේ. මිලිටරීකරණය හා ආගමික-වාර්ගික අන්තවාදය මෙන්ම රාජ්‍ය ආරක්ෂාවේ නාමයෙන් ගෙන එන මර්දන නීති යාන්ත්‍රණ ද ස්ත්‍රීන් වෙත පීඩාකාරී ලෙස බලපා ඇත. ඒවා ස්ත්‍රීන්ගේ ශරීරය සහ නිදහස් පැවතුම්වෙත කෙලින්ම එල්ලවී තිබේ. රටේ පවත්නා පොදු නීතිය තුළ සමාන අයිතීන් සහිත පුද්ගලයන්වන ස්ත්‍රීන්ගේ ඇවතුම් පැවතුම් පුරුෂ කේන්ද්‍රීයව පාලනය කිරීම සඳහා නීති සම්පාදනය වීම වැනි අවස්ථාවලදී ස්ත්‍රීන් කෙරෙහි එල්ලවන සංස්කෘතික මර්ධනය නීතිය හරහා සුජාතකරණය කිරීම ද දැකිය හැකි ය.මෙම තත්වය තුළ, ස්ත්‍රීන්ට බලපාන ගැටලු පොදු සමාජ අර්බුදයතුලම විසඳාගතයුතුව පවතින ගැටලු ලෙස තේරුම් ගැනීම හා විග්‍රහ කරගැනීම මගහැර ස්ත්‍රිය එයින් බැහැරකරලනු ලබන බව අපගේ විශ්වාසයයි. මෙකී හේතු නිසා මෙම සමාජ ආර්ථික ක්‍රමය වෙනස් කිරීම සඳහා  ස්ත්‍රීන් සංවිධානය වීම, බලමුළු ගැන්වීම සහ අරගල කිරීම අත්‍යාවශ්‍ය ක්‍රියාවලියක් යයි අපි විශ්වාස කරමු. ශ්‍රී ලංකාව තුළ අයිතිවාසිකම් පිළිබඳ අරගල කිරීමේ ඉතිහාසයට ජීවය දෙනු ලැබුවේ ශ්‍රී ලංකාවේ ප්‍රගතිශීලී, වාමාංශික ස්ත්‍රීන් විසිනි. ස්ත්‍රීන්ගේ ගැටළු මෙන්ම ස්ත්‍රීන්ගේ අරගල ද පොදු සමාජ අර්බුදයෙන් සහ පොදු අරගලවලින් වෙන් කොට ආන්තිකකරණය කළ නොහැකි ය. එබැවින් ස්ත්‍රීවාදය යනු බොහෝ මතවාදයන් හා  න්‍යායන් අතර තවත් රාමුවක් ලෙස නොසළකා, මෙම සමස්තසමාජ අර්බුදයම කෙන්ද්‍රීයකොටගත්ප්‍රබල මතවාදයක් වනබව අපි විශ්වාස කරමු. සමාජ වෙනසක් අපේක්ෂාසහගතව සිටින සමාජ ප්‍රවාහය හැරවුම් ලක්ෂයකට එළඹී ඇති  මේ මොහොතේ එම ප්‍රවාහය තුළ  ස්ත්‍රී බලවේගය අනිවාර්යයෙන්නියෝජනය විය යුතු  යයි ද අපි අවධාරණය කරමු.

එමෙන්ම ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳව සමාජය විසින් ගොඩ නංවනු ලැබ, අගතිගාමී ලෙස  ක්‍රියාත්මකව පවත්නා අධිපති මතවාද විසින් ස්ත්‍රීන්ට සේම සමාජය තුල ජීවත්වන වෙනස්කම් සහිත පුද්ගලයන්ට පමණක් නොව, පිළිගත් සමාජය විසින් ආන්තීකරණයට ලක්කරන ලද සමාජ කොටස්වලට ද සමරිසි, සංක්‍රාන්ති සමාජභාවී ප්‍රජාවන්ටද බලපාන බරපතල හිංසාකාරී සහ පීඩාකාරී තත්වයන් නිර්මාණය කොට ඇත. ඔවුන් නොසලකා හැරදමා තිබේ. එහෙයින් ගැඹුරු අසමානතා සහිත මෙම සමාජ තත්ත්වය අපිප්‍රතික්ෂේප කරමු. සියල්ලන්ටම නිදහස සහ සමානාත්මතාව තහවුරු වූ, හිංසනයෙන් හා පීඩාවන්ගෙන් තොරව ජීවත් විය හැකි සමාජයක් උදෙසා අපි වෙහෙසෙන්නෙමු. අප මෙහිදී ස්ත්‍රීවාදය යනුවෙන් අදහස් කරන්නේ ස්ත්‍රීන් පමණක් නියෝජනය වන දේශපාලනයක් නොවේ. ඉහතකී ආන්තීකරණය වූ වෙනත් සමාජ කොටස් ද නියෝජනය කරන සියලු ප්‍රජාවන් මෙන්ම ළමුන්  දසත්වයන් ද මිහිතලයට ජීවය දෙන හරිත පරිසරයද සුරකින දේශපාලනික න්‍යාය-භාවිතාවකි.

# ජාතික ජන බලවේගය තුළ අපගේ භූමිකාව

වර්තමානය වන විට ලාංකීය දේශපාලනය වැදගත් සන්ධිස්ථානයකට එළඹී ඇත. දශක හතකට අධික කාලයක් ශ්‍රී ලංකාව තට්ටුමාරු ක්‍රමයට පාලනය කළ දේශපාලන පන්තියවිසින් මහා අගාධයකට රට ඇද දමා තිබෙන තත්වයක් තුළ ඔවුන් කෙරෙහි ජනතා අප්‍රසාදය කවරදාකටත් වඩා උත්සන්නවීමෙන්,වඩා ශක්තිමත් විකල්ප දේශපාලන අවකාශයක් විවර වී පෙරට යමින් තිබේ. දැඩි වී ඇති ආර්ථික අර්බුදය ද, නොවිසඳුණු සමාජ ගැටලු ගණනාවක් ද හමුවේ නව ආරක දේශපාලන අපේක්ෂාවක ප්‍රකාශමාන වීමක්, පිළිඹිබුවක් ලෙස ජාතික ජන බලවේගය හැඳින්විය හැකිය. ජාතික ජන බලවේගයවටා සිවිල් සංවිධාන ගණනාවක් මේවනවිටද එක්වෙමින් සිටින්නේ, මෙම දේශපාලන අවශ්‍යතාවයට ආමන්ත්‍රණය කිරීමේ උත්සාහයක් ලෙසය. ජාතික ජන බලවේගයෙහි ස්ත්‍රී ක්‍රියාකාරීත්වය ඒකරාශී කොට බලමුළුගන්වා ශක්තමිත් ව්‍යාපාරයක් ලෙස සංවිධානගත කොට පෙරට යාමේ අදිටනින් මෙම 'ප්‍රගතිශීලී ස්ත්‍රී එකමුතුව' ගොඩ නැගී ඇත. අප මූලික වශයෙන් මෙම ප්‍රයත්නය දරන්නේ මෙම විවර වී ඇති දේශපාලන අවකාශය ප්‍රගතිශීලී වාමාංශික ස්ත්‍රී එකතුවක් ලෙස වරනැගිය හැකි ආකාරය ගවේෂණය කිරීම ඔස්සේය. ජාතික ජන බලවේගයෙහි මැතිවරණ ව්‍යාපෘතිය තුළ ද ඉන් ඔබ්බට සංවිධානය වන දේශපාලන ක්‍රියාවළිය තුළ ද ස්ත්‍රීන්ට බලපාන ගැටළු සහ පොදු සමාජ ගැටළු අතර සාම්‍යයක් ගොඩනගමින් දැනට දේශපාලනික ප්‍රවාහයෙන් ආන්තිකකරණය වී ඇති ස්ත්‍රීන් යළි තීන්දු තීරණ ගන්නා ක්‍රියාකාරී දේශපාලනයට ඔසවා තැබීමේ මුඛ්‍ය පරමාර්ථයෙන් අපි ක්‍රියාත්මක වෙමු.

## අපගේ ඉල්ලීම් :

1. නවලිබරල් ධනවාදය විසින් නිර්මාණය කරනුලබන සහ දැනටමත් සිදු කර ඇති ආර්ථික විෂමතාවයන්ට එරෙහිව සංවිධානය වීමට අවශ්‍ය දේශපාලනික සහයෝගය ලබා දීම
    - අවදානම් සහගත ආර්ථික කණ්ඩායම් හා අවිධිමත් ආර්ථික ක්ෂේත්‍රය මත පදනම් වූ ආර්ථිකයට තිරසාර විසඳුම් ලබාදීම
    - වෘත්තීය සමිතිගත වීමට හා සාමූහිකව කේවල් කිරීමට වැඩ කරන ජනතාවට ඇති බාධක ඉවත් කිරීම
    - කම්කරු අයිතීන් කප්පාදු කරන මෑන් පවර් පදනම මත රැකියාවනට බඳවා ගැනීම් නවතාලීම හා දැනට පවතින එවන් ආයතන නියාමනය කිරීම සඳහා නීති ප්‍රතිසංස්කරණ ඉදිරිපත් කිරීම තුළින් කාර්මික ප්‍රජාතන්ත්‍රවාදය වර්ධනය කිරීම
    - ජීවත් වීමට සරිලන වැටුප්, අධිකතර අතිකාල වැඩ නොමැතිව ඉපැයීමට හැකි වන පරිදි පෞද්ගලික අංශයේ මූලික වැටුප් ඉහළ නැංවීම හා ඒ අනුව ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ බහුතරයක් අතර බෙදා හැරීමට සැලැස්වීම
    - ග්‍රාමීය ආර්ථිකය නගා සිටුවීම සඳහා අවශ්‍ය කෘෂිකර්මාන්ත, ධීවර කර්මාන්ත හා ඉඩම් ප්‍රතිසංස්කරණ වෙනුවෙන් පෙනී සිටීම
    - ස්ත්‍රීන්ව සියදිවි නසාගැනීමට පවා පොළඹවා තිබෙන බැංකු හා මූල්‍ය ආයතන විසින් අනුගමනය කරන ණය දීමේ ක්‍රම මගින් සිදු කෙරෙන සූරා කෑමේ පිළිවෙත් වෙනුවට ප්‍රජාවන්ගේ ආර්ථික අවශ්‍යතා සපුරාලිය හැකි ආර්ථිකයක් වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපත්තියේ වෙනස්කම් සිදු කිරීම
    - ශ්‍රම බලකායටස්ත්‍රීන්ගේ දායකත්වය ලබා ගැනීමට පවතින බාධා ඉවත් කිරීම සහ ප්‍රජනන කාර්යයන් හා සම්බන්ධ භූමිකා සමාජ වගකීමක් ලෙස සළකා ඒ අනුව එම අදාළ භූමිකා පවත්වාගෙන යාමට පහසුකම් සැළසීම
    - රැකියා සඳහා විදේශගත වීමේදී එම ශ්‍රමිකයන්ට අදාළ පුහුණුව විදේශගත වීමට පෙර ලබා දීම සහ රටට විදේශ විනිමය සපයා දෙන්නවුන් ලෙස ඔවුන්ට සහ ඔවුන්ගේ පවුල්වලට අවශ්‍ය රැකවරණය සහ පහසුකම් සැළසීමේ ක්‍රමවේද සකස් කිරීම
    - වතු කම්කරු දිනක වැටුප අවමය රු 1000/- ක් බවට පත්කිරීම

2. ස්ත්‍රීන්ට අසාධාරණ ලෙස සහ අසමාන ලෙස සළකන නීති ප්‍රතිසංස්කරණය කිරීම
    - සිය ශරීරය සහ දරුවන් වැදීම පිළිබඳ අයිතිය ස්ත්‍රිය සතු අයිතියක් ලෙස පිළිගෙන ඒ අනුව අදාළ නීති සංශෝධනය කිරීම
    - විවාහ සහ දික්කසාද නීති පුද්ගල අයිතිවාසිකම් තහවුරු වන අයුරින් සංශෝධනය කිරීම
    - මුස්ලිම් පෞද්ගලික නීති ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය ස්ථාපිත කිරීම
    - ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කිරීම සහ ප්‍රතිත්‍රස්ත පනත වැනි නව පනත් හඳුන්වා දීම වැළැක්වීම
    - නීති පද්ධතිය යොදාගෙන සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් කප්පාදු කිරීමට විරුද්ධ වීම

- දෑවැද්ද, කාන්තා සහ පිරිමි ලිංගේන්ද්‍ර අංග ඡේදනය වැනි පාරම්පරික පරිචයන් නිසා පීඩාවට සහ හිංසනයට ලක් වීම නැවැත්වීම සඳහා නීති සකස් කිරීම
- ලිංගික අපයෝජන සම්බන්ධව පවතින පුනරුත්ථාපන හා ආරක්ෂණ සේවාවන්හි අඩුලුහුඩුතා ඉවත් කර කාර්යක්ෂම ලෙස නීතිය ක්‍රියාත්මක කිරීම
- ලිංගික දිශානතිය සහ සමාජභාවී අනන්‍යතාව අපරාධකරණයට ලක් කරන නීති ප්‍රතිශෝධනය කිරීම සහ තෝරා ගත් රැකියාව කුමක් වුවත් එයට අවශ්‍ය සමාජ රැකවරණය සැළසීම
- අයාල ආඥා පනත අහෝසි කිරීම
- ස්ත්‍රී ගෘහමූලිකයන්ගේ ඉඩම් අයිතිය තහවුරු වන ලෙස නීති සංශෝධනය කිරීම
- ළමයෙකු යනු වයස අවුරුදු 18 ට අඩු තැනැත්තකු ලෙස සළකමින් ඒ අනුව සියලු නීති සම්පාදනය කිරීම

3. ස්ත්‍රීන්ගේ දේශපාලනික නියෝජනය, සහභාගීත්වය, හා භූමිකාව මූලප්‍රවාහයේ සාකච්ඡාවට ලක් කිරීමට දේශපාලනික සහයෝගය ලබා දීම
   - ස්ත්‍රීන් දේශපාලන පක්ෂ තුළ තීරණ ගැනීමේ භූමිකාවන්ට අවතීර්ණ කර ගැනීම සඳහා දේශපාලන පක්ෂ තුළ සක්‍රිය ක්‍රමවේද සකස් කිරීම
   - ප්‍රචණ්ඩත්වය සහ හිංසනය ප්‍රමුඛ කර ගත් දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීම තුලින් ස්ත්‍රිය දේශපාලනික ප්‍රවාහයට ඇද ගැනීමට සහාය වීම
   - රැකියා සඳහා රට තුළ සහ රටින් පිටත සංක්‍රමණික පුද්ගලයින්ගේ ඡන්ද අයිතිය තහවුරු කිරීම
   - සියලුමැතිවරණවලදී කාන්තා නියෝජනය සඳහා 50%ක කෝටාවක් ක්‍රියාත්මක කිරීම
   - ජීවිතයට ඇති අයිතිය මූලික අයිතියක් ලෙස පිළිගෙන එය සුරැකීමට අවශ්‍ය නීතිමය පියවර සැලසීම
   - රටේ ප්‍රධාන තීන්දු සහ තීරණ ගන්නා ආයතන තුළ කාන්තා නියෝජනය අනිවාර්ය කිරීම

4. ආයතනගත හිංසන ව්‍යුහයන් ඇතුළුව සියලු ආකාරයේ හිංසනයන්ට විරුද්ධ වීම සහ ලිංගික හිංසනය, ගෘහස්ථ හිංසනය, නවක වධය, සේවා ස්ථානයේදී හා ප්‍රවාහනයේදී සිදුවන හිංසනයන්ට එරෙහිව නීති යාවත්කාලීන කිරීම

5. අධ්‍යාපනය, ආගම්, ජනමාධ්‍ය යනාදී විවිධ ආයතන විසින් ප්‍රතිනිෂ්පානය කොට පවත්වාගෙන යනු ලබන ස්ත්‍රීපුරුෂභාවය පිළිබඳ ඒකාකෘතීන්ගේ අගතිගාමී ස්වරූපයන්ට එරෙහි වීම සහ විකල්ප මතවාද ගොඩ නැංවීම සහ ස්ත්‍රීන් සහ පුරුෂයින් විසින් කරපින්නාගෙන යනු ලබන අගතිගාමී සහ ගතානුගතික විශ්වාස, ආකල්ප සහ මිත්‍යා මතයන්හි වාහකයින් වැළැක්වීමට අවශ්‍ය මැදිහත් වීම් සිදු කිරීම

6. අධ්‍යාපනය, සෞඛ්‍යය, ප්‍රවාහනය, නිවාස ඇතුළු අයිතිවාසිකම් මත පදනම් වූ විශ්වීය සමාජ ආරක්ෂණ පොදු සේවා තහවුරු වන ප්‍රතිපත්තිමය තීන්දුගැනීම සහ ප්‍රතිපාදන සකස් කිරීම
7. උත්සන්න වෙමින් පවතින ආගමික සහ වාර්ගික ජාතිවාදයන් පරාජය කිරීම සඳහා විවිධ ජනවර්ග අතර අවබෝධය වර්ධනය වන වැඩපිළිවෙළක් සකස් කිරීම සහ එවැනි ප්‍රවණතායන්ට විරුද්ධ වන ස්ත්‍රීන් බලගැන්වීම
8. සතා සීපාවා සහ තුරුලතා සහිත පරිසරය ආරක්ෂා කිරීම සහ තිරසාර පරිසර සංරක්ෂණ ප්‍රතිපත්ති සංවර්ධනයේ අත්‍යවශ්‍ය අංග බවට පත් කිරීම

## අපගේඅභිප්‍රායන් හා ක්‍රියාකාරීත්වය:

1. ප්‍රගතිශීලි ස්ත්‍රී එකතුව ස්ත්‍රී ක්‍රියාකාරිකයන් අතර ඒකාබද්ධ පුළුල් සංවිධානයක් ලෙස ගොඩනැගීම
2. ජාතික ජන බලවේගය තුළ බලපෑම් කණ්ඩායමක් ලෙස ක්‍රියාත්මක වෙමින් ඒ හරහා පොදු ස්ත්‍රී ප්‍රඥප්තියක් එම වේදිකාවට එක් කිරීම
3. මැතිවරණ වේදිකාවෙහි මෙන්ම ඉන් පිටතදී ද දේශපාලනික ගැටලු වාමාංශික ස්ත්‍රී ආස්ථානයකින් වරනැගීමට අවශ්‍ය දෘෂ්ටිවාදාත්මක පදනම සහ පසුබිම සකස් කිරීම
4. සමාජය තුළ දැනට දක්ෂිණාංශික සහ ජාති/ආගම්වාදී ප්‍රධාන පක්ෂ වටා රොක්වී සිටින ස්ත්‍රීන්ට ආමන්ත්‍රණය කළ හැකි සමාජ පණිවිඩයක් ලෙස ස්ත්‍රී ක්‍රියාකාරී කම්ටුවෙහි ප්‍රකාශන සකස් කිරීම
5. ශ්‍රී ලංකාවේ විවිධ දිස්ත්‍රික්ක තුළ මහජන මත විමසීම් ආකෘතියෙන් ස්ත්‍රීන්ට පැමිණ තම අදහස් දැක්විය හැකි වේදිකාවක් සකස් කිරීම
6. ජාතික සහ අන්තර්ජාතික, කලාපීය සහ ගෝලීය ස්ත්‍රී ව්‍යාපාර සමග සහයෝගීව ක්‍රියා කිරීම සහ අන්තර්සයෝගිතාව සඳහා වැඩ කිරීම
7. විවිධ සමාජ, දේශපාලන, ආර්ථික සහ සංස්කෘතික ප්‍රවණතා සහ තත්වයන් පිළිබඳ අධ්‍යයන සහ පර්යේෂණ ඒකකයක් පිහිටුවීම

# Manifesto

Progressive Women's Collective
National People's Power

Our primary aim is to bring to the centre of the current political discussion the socio-economic, cultural and political problems faced by women. The Progressive Women's Collective (PWC)constitutes individuals and groups aligned with feminist and leftist ideals, and we are organised as a pressure group within the current alternative political space. As such, the PWC has joined the National People's Power to bring the feminist agenda to the political programmes of the newly emerging political movement in Sri Lanka.

**The purpose of this document is to describe the key political positions of our group.**

We take the position that women are an integral and important part of society. If we are to understand the current social crisis, we must examine its intersectional and differential character from a feminist standpoint. Because women are marginalized from the key socio-economic, political, and cultural processes that affect them, women are often neglected, condemned to inequality, and injustice. Such marginalization, characteristic of capitalism in general, has become even more pronounced in the economic discourse of neoliberalism, which emerged in the last few decades. Although women's situation seems to have improved superficially, this process has, in fact, laid an unbearable pressure upon women. The structural and ideological change that we, as feminists, envision, have not been addressed by these superficial changes. Instead, it has led to the further exploitation and the commodification of women, turning her into yet another object exploited for accumulating profits. Widows, single women, abandoned, and differently abled women, particularly in post-war Sri Lanka, are most deeply affected by this socio-cultural and economic situation.

Furthermore, as a result of the feminisation of labour, women have become the primary income earners within the national economy. The economic changes brought about through this process have led to precarious labour conditions for both women and men. Moreover, the weakening of education, health, and the social security net in general directly impacts women. Militarisation, ethno-religious extremism and the illiberal legal instruments that are being introduced under the guise of "national security" also oppress women by directly impacting women's right to their bodies and freedoms. Laws affecting women are often written from a patriarchal perspective with the intention of controlling women. Rather than considering the issues faced by women as reflective of the larger crisis in society, women's issues are treated as separate and disconnected leading to further exclusion and marginalisation. Therefore, we believe that in order to transform the status of women, we must be organised, and that all women must be empowered to fight for their rights.

In fact, progressive and leftist women have a long history of leading many social and political struggles in Sri Lanka. Therefore, feminism is not just another political perspective but a critical and vital framework through which we can better understand the crisis within society as a whole. At this moment when there is the possibility of a transformative, alternative turn in our society and polity, we emphasise that feminist praxis must be represented firmly within it.

We also note that the conservative and dominating interpretations of genderoppress, not only women, but all those who are marginalised by mainstream society including the LGBTQI communities. In wildly unequal situations, all those who are considered non-normative are bound toface severe harassment and pressures. The rights of such persons have been largely ignored by society. Therefore, we reject the heteronormative gender system that creates deep inequalities, and subject those not privileged by the system to oppression and exploitation. We strive for a society where all can enjoy equality, freedom, and lives free of such oppression and harassment. Thus, by feminism we mean a praxis that addresses the issues faced by women, all those living outside the heteronormative framework, trans persons, children, other marginalised social groups,the intersections between them, as well as the the challenges posed to us by the crises of environmental depletion.

## The role of the PWC
within the NPP

Sri Lankan politics has reached a critical juncture today. After more than 70 years of rule by a traditional political class formed through various alliances, the desire for an alternative political force is developingstrongly. We are a group of feminist individuals and organisations who are collectively organized as the Progressive Women's Collective to work in solidarity with other members/groups of the NPP.Our goal is to ensure that the issues faced by women become a central concern within the NPP and that women who are traditionally marginalised from mainstream politics are able to come to the forefront through this alternative space.

## **Our** Demands

1. Support struggles against the economic inequalities that have been produced by the neo-liberal capitalist system
    - Find sustainable solutions for the economy currently based on precarious economic groups and the informal sector
    - Introduce law reforms and regulate existing institutions in order to enhance industrial democracy by affirming the right of workers to unionise and for collective bargaining
    - Prevent the recruitment of workers through man-power agencies that denies them their rights as workers
    - Advocate for a living wage in the private sector so that people are able to earn an adequate level of income without working overtime,thereby ensuring that the benefits of economic growth are distributed among the majority
    - Affirm the need for relevant reforms in sectors such as fisheries, agriculture and land reform in order to uplift rural economies
    - Introduce financial reforms that will meet the economic needs of economically vulnerable communities rather than the existing loan schemes promoted by banks and financial companies that are exploiting women and driving them to suicide
    - Remove barriers that prevent women from engaging in the labour force and ensuring that necessary services are provided to fulfil the responsibilities related to reproductive roles, which should be regarded as a collective social responsibility
    - Ensure that migrant workers are trained in the relevant sectorsprior to migration and that necessary protections are in place for them and their families
    - Increase the daily wage of estate workers to a minimum of Rs 1,000.00

2. Reform all laws that treat women unequally
    - Legal reforms that affirm women's right to their bodies and their reproductive roles
    - Ensure individual rights in marriage and divorce
    - Reform Muslim personal laws
    - Repeal the Prevention of Terrorism Act and prevent the introduction of new laws such as the Counter-Terrorism Act
    - Prevent the use of law and legal reforms that curtail minority rights
    - Formulate laws to prevent harmful traditional practices such as the dowry, male and female circumcision etc.
    - Remove loopholes in laws and procedures relating to sexual violence and improve related social protection services
    - Repeal laws that criminalize non-heterosexual behaviours and ensure legal protection for all women regardless their chosen employment
    - Repeal Vagrant's Ordinance and other laws which are used to criminalise working women
    - Affirm the land rights of female heads of households

- Reform all laws to be consistent with the principle that all individuals below 18 years are children

3. Support the mainstreaming of the discussion on women's political participation and political roles
    - Reform procedures within political parties to increase the participation of women in internal decision making bodies
    - Change the existing violent and exploitative political culture
    - Ensure the voting rights of migrant workers
    - Introduce a quota of 50% for women in all elections
    - Accept the right to life as a fundamental right
    - Compulsory inclusion of women in all public decision-making bodies

4. Oppose the institutionalisation of all forms of violence in society including sexual harassment, domestic violence, ragging, harassment in the workplace and in public transport, and corporal punishment

5. Oppose the gender stereotypes being reproduced through education, religion, media etc. and support the development of alternative progressive ideologies and intervene to prevent the spread of regressive and harmful myths, superstitions, traditions, andattitudes etc.

6. Counter rising ethno-religious nationalismthrough sustained efforts to maintain inter-racial and inter-religious understanding, and support women who organize against xenophobic ideologies

7. Take policy decisions and allocate funds to ensure that the basic needs of individuals including education, health, transport and housing etc. are met

8. Make sustainability and environmental protection an essential aspect of development policies

## **Purpose and** Current Action

1. To strengthen the Progressive Women's Collective through collaboration with existing women's organisations and activist women

2. To collectively present a women's manifesto to the NPP

3. To create an ideologically progressive and leftist environment within which women's issues can be framed and discussed in political campaigns and beyond

4. To design political materials that can reach out to women who are currently mobilised around the right wing, racist politics of mainstream parties

5. To initiate consultative public representation mechanisms in all districts to enable women to be heard

6. To build solidarities with regional, international, and global women's movements, and to develop links with other women's movements for international and regional cooperation

7. To establish a research unit that studies social, economic, political, and cultural trends that affect women and LGBTQI groups